සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2025-01
Learning Resource Center
Dr. Mazenod College
Kandana
48588

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
# ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
# Year End Evaluation - 2024 (2025)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි |
| නම / பெயர் / Name: ........................ | | විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: ................ | |

## I කොටස

- <u>ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.</u>
- <u>දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.</u>

01. මුදුන් මූල පද්ධතියක් දැකිය හැකි ශාක යුගලය වන්නේ පහත කවරක් ද?
i. කිතුල්, පුවක් ii. සල්, පොල් iii. කරපිංචා, බෙලි iv. ගොයම්, උක්

02. වෙනත් ද්‍රව්‍යයකින් පිරිමැදීම මගින් ආරෝපණ ගැන්වීමක් කළ නොහැකි ද්‍රව්‍යයකි,
i. වානේ ii. එබනයිට් iii. වීදුරු iv. ප්ලාස්ටික්

03. මෙහි දැක්වෙන්නේ බයිසිකල් ඩයිනමෝවකට
\+ හා - අග්‍ර විරුද්ධ වන ලෙස සම්බන්ධ කළ LED
දෙකක් හා මැද බින්දු මිලි ඇමීටරයක් සහිත පරිපථයකි.
ඩයිනමෝවේ විල්ල කැරකැවීමේ දී දැකිය හැකි
නිරීක්ෂණයක් වන්නේ පහත කවරක් ද?




i. LED දෙකම එකවර දැල්වී තිබීම.
ii. LED දෙක මාරුවෙන් මාරුවට දැල්වීම.
iii. මැද බින්දු මිලි ඇමීටරයේ දර්ශකය එක් දිශාවකට පමණක් චලනය වීම.
iv. මැද බින්දු මිලි ඇමීටරයේ දර්ශකය එහි බින්දුව අගය ඇති ස්ථානයේම පැවතීම.

04. පහත පිළිතුරු අතරින් උදාසීන ද්‍රව්‍ය පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
i. මද්‍යසාර, විනාකිරි. ii. භූමිතෙල්, ලුණු ද්‍රාවණය.
iii. සබන් දියර, ආප්පසෝඩා. iv. අළු මිශ්‍ර ජලය, මද්‍යසාර.

05. පහත සඳහන් කාර්යයන් විමසා බලන්න.
A - සෞඛ්‍ය කටයුතුවල දී එන්නත් වර්ග, සේලයින් වැනි දෑ නිපදවීම.
B - රෙදි පිළිවල තැවරුණු තෙල්, කුණු වැනි දෑ සෝදා හැරීම.
C - සාන්ද්‍ර අම්ල තනුක කර කෘත්‍රිම විනාකිරි, බැටරි ඇසිඩ් නිපදවීම.
මේවා අතරින් ජලයේ ද්‍රාවක ගුණය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා වන්නේ,

i. A හා B පමණි. ii. B හා C පමණි. iii. A හා C පමණි. iv. A, B, C සියල්ලම.

06. මුහුදු වෙරළ ආශ්‍රිතව පමණක් හමුවන අපෘෂ්ඨවංශී සත්ත්වයෙකි,
i. ගොළුබෙල්ලා ii. කැරපොත්තා iii. පසැගිල්ලා iv. කැස්බෑවා

07. මෙහි දැක්වෙන ඇටවුම ආශ්‍රිතව අපට අත්දැකිය නොහැකිවන ශක්ති ආකාරය වන්නේ පහත කවරක් ද?



i. ආලෝක ශක්තිය. ii. ධ්වනි ශක්තිය.
iii. විද්‍යුත් ශක්තිය. iv. තාපජ ශක්තිය.

08. තැම්බූ බිත්තරයක හරස්කඩ සමඟ පැටීවියේ හරස්කඩ සැසඳූවිට ගැලපෙන පිළිතුර පහත කවරක් ද?
i. බිත්තරයේ කටුව - පෘථිවියේ කබොල. ii. බිත්තරයේ කහමදය - පෘථිවියේ ප්‍රාවරණය.
iii. බිත්තරයේ සුදුමදය - පෘථිවියේ හරය. iv. බිත්තරයේ කටුව - පෘථිවියේ පිටත හරය.

09. ප්‍රරෝහණය වන බීජයක බීජ පත්‍ර පසෙන් ඉහළට පැමිණෙන්නේ පහත කවර ශාක යුගලයේ ද?
i. බඩඉරිඟු, මුං ii. බෝංචි, මෑ iii. වී, කව්පි iv. පුවක්, සියඹලා

10. අණ්වීක්ෂය, පරික්ෂය හා බහුරූපේක්ෂය යන උපකරණවල භාවිත වන තල දර්පණ සංඛ්‍යාවන් පිළිවෙලින්,
i. එකකි, දෙකකි, තුනකි. ii. දෙකකි, දෙකකි, තුනකි.
iii. එකකි, තුනකි, දෙකකි. iv. එකකි, දෙකකි, හතරකි.

11. අණ්වීක්ෂ භාවිතය සම්බන්ධයෙන් ලියා තිබූ වගන්ති තුනක් පහත දැක්වේ.
A - අණ්වීක්ෂ දූවිලි නොරඳන ලෙසින් සිරස්ව ගබඩා කළ යුතු ය.
B - දිගු කලක් භාවිතා නොවන විට එහි සියලු කොටස් ගලවා ඩෙසිකේටරයක බහාලීම.
C - භාවිතයෙන් පසු කාච හා වේදිකාව පිරිසිදු රෙදි කඩකින් පිස දැමීම.
මින් නිවැරදි වන්නේ,
i. A හා B පමණි. ii. B හා C පමණි. iii. A හා C පමණි. iv. A, B, C සියල්ලම.

12. මෙම රූපයේ දැක්වෙන ක්‍රියාකාරකම මගින් ආදර්ශනය කරන ලද්දේ පහත සඳහන් කවරක් ද?




i. ධ්වනිය ගමන් කිරීමට මාධ්‍යක් අවශ්‍ය බව.
ii. ද්‍රවමය මාධ්‍යය තුළින් ධ්වනිය ගමන් කරන බව.
iii. පුනීල හා බැලුන් පටලවල විවිධ භාවිත ඇති බව.
iv. වෙද නලාවක සැකැස්ම මගින් බාහිර කටයුතු කළ හැකි බව

13. ශාකයක දක්නට ලැබෙන අවයව කිහිපයක් පහත ලැයිස්තුවේ දැක්වේ.
a. පුෂ්ප b. කඳ c. පාර්ශ්වික මුල්
d. ඵල e. අල f. පත්‍ර
මින් ශාකයක ප්‍රරෝහ පද්ධතියට අයත් අවයව පමණක් ඇතුළත් පිළිතුර පහත කවරක්ද?
i. a, b, c, d ii. a, b, d, f iii. b, c, d, e iv. b, d, e, f

14. කැටි වැහි වලාකුළුවල මුදුන පැතලි වී කිණිහිරයක වැනි හැඩයක් ගන්නේ එය වායුගෝලයේ කවර ස්තරයකට ළඟා වූ විට ද?
i. ස්තර ගෝලයට ii. මධ්‍ය ගෝලයට iii. බහිර් ගෝලයට iv. පරිවර්තී ගෝලයට

15. වෛද්‍ය උෂ්නත්වමානයක භාවිත වන උෂ්ණත්ව පරාසය වන්නේ පහත කවරක්ද?
i. $0\,^0C$ - $25\,^0C$ ii. $25\,^0C$ - $35\,^0C$ iii. $35\,^0C$ - $43\,^0C$ iv. $43\,^0C$ - $100\,^0C$

16. පහත සඳහන් සතුන් අතරින් පහසුවෙන් හඳුනාගත හැක්කේ කවරෙක් ද?
i. ශාක අත්තක සිටින ඇහැටුල්ලෙක්.
ii. තණකොළ අතර සිටින පළගැටියෙක්.
iii. වියළි පඳුරු අතර ගැවසෙන දිවියෙක්.
iv. ජලාශයක සිටින දියකාවෙක්.

17. පහත දැවෙන ලක්ෂණ සලකා බලන්න.
A - පාංශු වාතය රඳවා ගැනීම අඩු වීම.
B - උළු, ගඩොල් වැනි දෑ සෑදීම සඳහා යොදා ගැනීම.
C - ජලය රඳවා ගැනීම හා ඇලෙන සුලු වීම.
මෙ අතරින් මැටි පසක ලක්ෂණ වන්නේ,
i. A හා B පමණි. ii. B හා C පමණි. iii. A හා C පමණි. iv. A, B, C සියල්ලම.

18. පහත දැක්වෙන ක්‍රියාවන් අතරින් ඇදීමක් සිදුනොවන අවස්ථාව කුමක් ද?
i. බරක් එසවීම. ii. බයිසිකලයක් පැදීම.
iii. රාක්කයකින් පොතක් ගැනීම. iv. මේස ලාච්චුවක් ඇරීම.

19. මිනිස් දේහය සෑදීමට දායක වූ පද්ධති අතරින් මුළු දේහය පුරාම පැතිරුණු පද්ධතියක් වන්නේ මින් කුමක් ද?
i. රුධිර සංසරණ පද්ධතිය ii. ශ්වසන පද්ධතිය
iii. ආහාර ජීර්ණ පද්ධතිය iv. ප්‍රජනක පද්ධතිය

20. පහත පිළිතුරු අතරින් ලිපිඩ බහුල ආහාර පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
i. පොල්, සෝයා, මස් ii. මාළු, බිත්තර, මස්
iii. දෙල්, පොල්, කරවල iv. තල, බටර්, මී කිරි

## II කොටස

- <u>පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු ලියන්න.</u>

01. (A) පාසලේ දී ඔබට කිරීමට තිබූ එක්තරා ක්‍රියාකාරකමකට අදාල ඇටවුමක් මෙම රූපයේ දැක්වේ. ජල බඳුනක තබන ලද P හා Q නම් ව්‍යුහ දෙකක් සමාන දිගැති නූල් දෙකකින් ගැටගසා, එම නූල් කෙළවර ක්ලේ බෝල දෙකක් එල්ලා ඇත.




i. මෙහි P හා Q ව්‍යුහ සාදා ඇත්තේ බණ්ඩක්කා කරල් භාවිතයෙනි. Q ව්‍යුහය සෑදීමට භාවිත කළ බණ්ඩක්කා කරල් කොටස් මොනවාද යන්න පහත රූපවලින් තෝරා අදාල ඉංග්‍රීසි අක්ෂරය/ අක්ෂර ලියන්න. (ලකුණු 01)




ii. ඇටවුමේ දැක්වෙන ක්ලේ බෝල දෙක එකවර පහළට අතහැරිය විට දක්නට ලැබෙන නිරීක්ෂණය කුමක්ද? (ලකුණු 02)

iii. Q ව්‍යුහයේ පරිදි වූ හැඩයක් හඳුන්වන නම කුමක් ද? (ලකුණු 01)

iv. බණ්ඩක්කා ශාකයේ, a. පත්‍රවල නාරටි වින්‍යාසය,
b. මූල පද්ධතියේ ස්වරූපය, ලියා දක්වන්න. (ලකුණු 02)

(B) රූපයේ දැක්වෙන පරිදි උපකරණ සකසා දණ්ඩ චුම්බකය කරකැවීම සිදු කරනු ලැබේ.

i. මෙහි දී දැකිය හැකි නිරීක්ෂණය කුමක් ද? (ලකුණු 01)

ii. එම නිරීක්ෂණය ලැබීමට හේතුව කුමක් ද? (ලකුණු 02)

iii. එම නිරීක්ෂණය තවදුරටත් වැඩි දියුණු කර ගැනීම සඳහා ඇටවුමේ කළ යුතු වෙනස්කමක් සඳහන් කරන්න. (ලකුණු 02)




iv. මෙම ඇටවුමෙන් ආදර්ශනය වනුයේ කවර උපකරණයක ක්‍රියාකාරිත්වය ද? (ලකුණු 01)

(C) පහත දැක්වෙන්නේ වක්‍ර දර්පණ වර්ග දෙකක් සහ ආලෝක කදම්බ වර්ග තුනකි.



(a) (b) (c) (d) (e)

i. (a) හා (b) වක්‍ර දර්පණ දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

ii. (c) ආලෝක කදම්බය (a) හා (b) දර්පණ මතට වෙන වෙනම පතනය වීමට සලස්වන ලදී. එහි දී එම දර්පණ මගින් ආලෝකය පරාවර්තනය වන ආකාරයන් (c), (d), (e) අතරින් තෝරා ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 16)

(B) පසක විවිධ ඛනිජ වර්ග, කාබනික ද්‍රව්‍ය, ජලය, වාතය මෙන් ම පාංශු ජීවීන් ද ඇතුලත් වේ.

i. පාංශු කාබනික ද්‍රව්‍ය හඳුන්වන කෙටි නම කුමක් ද? (ලකුණු 01)

ii. පාංශු කාබනික ද්‍රව්‍යවලින් කෙරෙන කාර්යයන් 2 ක් ලියන්න. (ලකුණු 02)

iii. කාබනික ද්‍රව්‍ය ඉතා බහුල පස් වර්ගය හඳුන්වන නම කුමක් ද? (ලකුණු 01)

iv. මැටි, වැලි, රොන්මඩ යන අංශු අතරින් රළු වයනයක් ඇති අංශු වර්ගය කුමක් ද? (ලකුණු 01)

(මුළු ලකුණු 11)

05. (A) මිනිසාගේ ආහාර ජීර්ණ පද්ධතිය මුඛයෙන් ඇරඹී ගුදයෙන් කෙළවර වන නාලාකාර ව්‍යුහයක් වේ. එහි පටු දිගු ස්ථාන මෙන්ම පළල් ස්ථාන ද වේ. ආහාර ජීර්ණ පද්ධතිය මඟින් ප්‍රධාන කාර්යයන් දෙකක් සිදු කෙරේ.

i. ආහාර ජීර්ණ පද්ධතිය මඟින් කෙරෙන එක් ප්‍රධාන කාර්යයක් ලියන්න. (ලකුණු 01)

ii. ආහාර ජීර්ණ පද්ධතියේ දැකිය හැකි පළලින් වැඩි පේශිමය මල්ලක් වැනි ව්‍යුහය කුමක්ද?(ලකුණු 01)

iii. ආහාර ජීර්ණ පද්ධතියේ දිගින් වැඩිම කොටස නම් කරන්න. (ලකුණු 01)

iv. මුඛයේ දී ආහාරයේ සිදුවන වෙනස්කමක් සඳහන් කරන්න. (ලකුණු 01)

v. ආහාර සමඟ කුඩා ගල්, වැලි කැට වැනි දෑ ආහාර මාර්ගයට ඇතුලුවීමේ ඉඩක් පවතී. පරිසරයේ අපට හමුවන විවිධ ගල් වර්ග පාෂාණ හා ඛනිජ ලෙසින් වර්ග කළ හැක.

(a.) පාෂාණ අතර සුලබව හමුවන, එමෙන්ම බහුලව ප්‍රයෝජනවත් වන පාෂාණ වර්ගයක් නම් කරන්න. (ලකුණු 01)

(b.) පෘථිවියේ ඇති පාෂාණ ස්වාභාවිකව නිර්මාණය වන ආකාරය අනුව වර්ග තුනකි. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(B) රූපයේ දැක්වෙන අන්වීක්ෂය ඇසුරින් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.




i. මෙහි P ලෙස දැක්වෙන කොටස සීරුමාරු කිරීමට ඇති උපාංගයක් නම් කරන්න. (ලකුණු 01)

ii. Q කොටස භාවිත වන්නේ කවරක් සඳහාද? (ලකුණු 01)

iii. මෙහි R ලෙස දැක්වෙන කොටසේ දර්පණ වර්ග දෙකක් වේ. ආලෝක තීව්‍රතාව අඩු මොහොතක යොදගත යුත්තේ ඉන් කවර දර්පණය ද? (ලකුණු 01)

iv. අන්වීක්ෂයෙන් යමක් නිරීක්ෂණයේදී ඔබේ ඇස තිබිය යුත්තේ කෙසේද? (ලකුණු 01)

(මුළු ලකුණු 11)

06. (A) පහත දැක්වෙන දෙබෙදුම් සුචිය සම්පූර්ණ කරන්න.

සතුන්

ගෙම්බා, ගැඩවිලා, ගොළුබෙල්ලා, මයිනා

පාද ඇත — (i) ........................, ........................
- පිහාටු ඇත — (iii) ........................,
- පිහාටු නැත — (iv)........................

පාද නැත — (ii) ........................, ........................
- කවචයක් ඇත — (v) ........................,
- කවචයක් නැත — (vi)........................

(ලකුණු $^1/2 \times 8 = 04$)

(B) පහත (අ) හි දැක්වෙන ක්‍රියාකාරකම්වල දී යෙදෙන බලයෙන් සිදුවන්නේ කුමක්ද යන්න (ආ) වලින් තෝරා යා කරන්න.

| (අ) | (ආ) |
|---|---|
| i. යකඩ දණ්ඩක් නැමීම. | - වස්තුවේ භ්‍රමණ ආවරණයක් සිදු කිරීම. |
| ii. දුන්නකින් ඊතලයක් විදීම. | - චලිතවන වස්තුවක් නිශ්චල කිරීම. |
| iii. බෝතල් මූඩියක් කරකවා ඇරීම. | - වස්තුවක හැඩය වෙනස් කිරීම. |
| iv. ගමන් ගන්නා වාහනයක ත්වරකය පෑගීම. | - නිශ්චල වස්තුවක් චලනය කිරීම. |
| v. ක්‍රිකට් ක්‍රීඩාවේ දී උඩ පන්දුවක් අල්ලා ගැනීම. | - වස්තුවක චලන දිශාව වෙනස් කිරීම. |
| vi. තමා වෙතට එන බෝලයකට හරවා පහරක් ගැසීම. | - චලිතවන වස්තුවක වේගය වැඩි කිරීම. |

(ලකුණු $^1/_2 \times 6 = 03$)

(C) පහත වගන්තිවල හිස්තැන් පුරවන්න.

i. කාර්යයක් කිරීමට ඇති හැකියාව ........................................................ ලෙසින් හැඳින්වේ.

ii. ............................................. ද්‍රව්‍ය හරහා ආලෝකය ගමන් නොකරයි.

iii. එක ළඟ පිහිටි ලක්ෂ්‍ය දෙකක් පැහැදිලිව වෙන්කර හඳුනාගැනීමේ හැකියාව ...................... හැකියාවයි.

iv. පරිසර වර්ණ හා ගැලපීම නිසා සත්ත්වයෙකු පරිසරයෙන් වෙන්කර හැඳිනීම අපහසු වීම .................................. ලෙසින් හැඳින්වේ.

(ලකුණු $1 \times 4 = 04$)

(මුළු ලකුණු 11)

07. (A) පහත වගන්ති නිවැරදි නම් '✓' ලකුණ ද, වැරදි නම් '✗' ලකුණ ද වරහන් තුළ යොදන්න.

i. පෘථිවි වායුගෝලයේ පවතින ස්තර අතරින් සිසිල්ම ස්ථරය මධ්‍ය ගෝලය යි. (    )

ii. ශ්‍රී ලංකාවේ ගම්බදව පවත්නා වාතයේ ඇති ඊයම් ප්‍රමාණය ඉහළ අගයක් ගනී. (    )

iii. ග්ලූකෝස් හඳුනාගැනීමට කරන බෙනඩික්ට් පරීක්ෂාවේ දී ගඩොල් රතු අවක්ෂේපයක් ලැබේ. (    )

iv. සූර්ය කෝෂවලින් විදුලිය නිපදවීමේ දී ඩයිනමෝවක් ද යොදා ගැනීම සිදුවේ. (    )

v. මී මැස්සන්, මදුරුවන් වැනි කෘමි සතුන් සිය පියාපත් වේගයෙන් සැලීමෙන් හඬක් උපදවයි. (    )

vi. විශාල ශාකවල මුල් ඇතැම් විට උප පස නම් ස්තරය දක්වා ද විහිදේ. (    )

(ලකුණු 06)

(B) පහත දැක්වෙන්නේ 7 ශ්‍රේණියේ සිසුන් කිහිපදෙනෙකු සකස් කරනලද ප්‍රශ්න හා ඊට අදාල පිළිතුරු සහිත කාඩ්පත් සමූහයකි. මෙහි දැක්වෙන ප්‍රශ්න හා පිළිතුරු සුදුසු පරිදි ගලපන්න. (නිදසුනක් ලෙස එක් ගැලපීමක් සිදුකර ඇත.) (කැපිටල් ඉංග්‍රීසි අක්ෂරවලින් ප්‍රශ්නද, සිම්පල් අක්ෂරවලින් පිළිතුරු ද දැක්වේ.)

| | | | | | |
|---|---|---|---|---|---|
| D | මේවා ආලගන්න මුල් සහිත ශාක වේ. | e | කහ, තැඹිලි, රතු | F | පෘථිවි වායුගෝලයේ හමුවන ප්‍රධානතම වායු වර්ග වේ. |
| c | නයිට්‍රජන්, ඔක්සිජන් | B | වායු දූෂණය අවම කරන ක්‍රමයක් වේ. | d | කොන්ඩිස්, ලූණු |
| C | pH කඩදාසි අම්ල සඳහා ලබා දෙන වර්ණ වේ. | a | සමෝච්ච කාණු කැපීම. | b | ගම්මිරිස්, බුලත් |
| E | පාංශු ඛාදනය අවම කරන ක්‍රමයක් වේ. | f | වනාන්තර ආරක්ෂා කිරීම. | A | ජලයේ හොඳින් දියවන ද්‍රව්‍ය වේ. |

| ප්‍රශ්නය | පිළිතුර |
|---|---|
| A | d |
| B | |
| C | |
| D | |
| E | |
| F | |

(ලකුණු 05)

(මුළු ලකුණු 11)

Learning Resource Centre R De Mazenod College Kandana

02. (A) විවිධ ශක්ති ආකාරයන් අප අවට ඇති අතර, කාර්යයන් කර ගැනීමේදී එක් ශක්ති ආකාරයක් තවත් ශක්ති ආකාරයක් බවට පත්වීම ශක්ති පරිණාමනය ලෙසන් හැඳින්වේ.

i. ඉන්ධන, ගිනිකූරු, රතිඤ්ඤා, ආහාර යන ද්‍රව්‍ය තුළ පොදුවේ ගබඩා වී ඇති ශක්ති ආකාරය කුමක්ද? (ලකුණු 01)

ii. ඔබ i හි සඳහන් කළ ශක්ති ආකාරය තාපය හා ආලෝකය යන ශක්ති ආකාරවලට පැහැදිලිවම පරිණාමනය කරනුයේ ඉහත සඳහන් ද්‍රව්‍ය අතුරින් කුමන ද්‍රව්‍යයද? (ලකුණු 01)

iii. බිම වැටී තිබූ පොතක් අහුලා මේසයක් මත තැබීමේ දී එම පොතෙහි ගබඩාවන ශක්ති ආකාරය කුමක්ද? (ලකුණු 01)

iv. (a) හිස් යෝගට් කෝප්ප දෙකක් සිහින් දිග නූලකින් සම්බන්ධ කර තනා ඇති මෙම උපකරණය මගින් පරීක්ෂා කර බැලෙනුයේ කවරක්ද?



(ලකුණු 01)

(b) ඔබ සඳහන් කළ කරුණ පරීක්ෂා කර බැලීමට මෙහි ඇති නූල කෙසේ තිබිය යුතුද? (ලකුණු 01)

(B) අප අවට ඇති වායුගෝලය සාධක දෙකක් පදනම් කරගනිමින් ස්තර පහකට බෙදා දක්වා ඇත. ඉන් පහතින්ම පිහිටි, අප වාසය කරන ස්තරය පරිවර්ති ගෝලය නම් වේ.

i. වායුගෝලය ස්තරවලට බෙදීමට පදනම් වූ එක සාධකයක් නම් කරන්න. (ලකුණු 01)

ii. වායුගෝලයේ අඩංගු මුළු වායු ප්‍රමාණයෙන් පරිවර්ති ගෝලය තුළ ඇතුලත් වන වායු ප්‍රතිශතය කොපමණද? (ලකුණු 01)

iii. වායු ගෝලයක් පැවතීම අනෙක් සතුන්ට සාපේක්ෂව පක්ෂීන්ට වැදගත් වන්නේ කෙසේද? (ලකුණු 01)

iv. මෙහි දැක්වෙන්නේ 400m ධාවන පථයකි. මෙහි A ස්ථානයෙන් 800m ධාවන තරගයක් ආරම්භ කෙරේ.




(a) එම තරගය අවසන් කළ ක්‍රීඩකයෙකු ගෙවා ගිය දුර ප්‍රමාණය සහ ඔහුගේ විස්ථාපනය වෙන වෙන ම ලියා දක්වන්න. (ලකුණු 02)

(b) ක්‍රීඩකයෙකුගේ විස්ථාපනය සඳහා ඔබ දුන් පිළිතුර ලැබීමට හේතුව කුමක් ද? (ලකුණු 01)

(මුළු ලකුණු 11)

03. (A) අප ජීවත්වන පෘථිවියේ මතුපිට ස්තරය වන කබොල භූ තැටි නම් කොටස්වලට බෙදී ඇතැයි පැවසේ. එම භූ තැටි දැක්වෙන සිතියමක් රූපයේ වේ.



i. සිතියමට අනුව ශ්‍රී ලංකාව පිහිටි භූ තැටියට මායිම්ව නැගෙනහිරින් පිහිටි භූ තැටිය කුමක් ද?

(ලකුණු 01)

ii. භූ තැටි එකිනෙකට සාපේක්ෂව චලනය වන ආකාර තුනකි. ඉන් භූ කම්පන ඇති වීමට බලපාන චලන ආකාරයක් ලියා දක්වන්න.

(ලකුණු 01)

iii. භූ විද්‍යාඥයින් පෘථිවි අභ්‍යන්තරය පිළිබඳව වැඩියෙන්ම තොරතුරු ලබාගන්නේ කවරක් පිළිබඳව අධ්‍යයනයෙන් ද?

(ලකුණු 01)

iv. ඔබ පාසලේ දී පෘථිවි ආකෘතියක් තැනීමට භාවිත කළ ද්‍රව්‍යයක් නම් කරන්න. (ලකුණු 01)

v. පෘථිවියෙන් වැඩි ප්‍රමාණයක් ජලයෙන් වැසී ඇත. ජලයේ දියවී ඇති දෑ වෙන් කර ගැනීම අපට විවිධ අවස්ථාවල දී ප්‍රයෝජනවත් වේ.

(a) එවැනි එක් අවස්ථාවකට උදාහරණයක් දෙන්න. (ලකුණු 01)

(b) උණ වැළඳී ඇති අවස්ථාවක රෝගියාගේ සිරුර ජලයෙන් තෙත් කිරීමක් කරනුයේ ජලයේ ඇති කවර ගුණයක් නිසා ද?

(ලකුණු 01)

(B) තුලිත ආහාර වේලක් යනු පෝෂණ සංඝටක සියල්ලම හා තන්තු අවශ්‍ය ප්‍රමාණයට ඇතුලත් වූ ආහාරයකි.

i. තුලිත ආහාර වේලක් නොගැනීමෙන් ඇතිවිය හැකි අහිතකර තත්ත්වයක් සඳහන් කරන්න.

(ලකුණු 01)

ii. ආහාර වේලෙහි තන්තු ඇතුලත්වීමේ වැදගත්කමක් සඳහන් කරන්න. (ලකුණු 01)

iii. සිරුරේ ගෙවී ගිය පටක කොටස් අලුත්වැඩියාවට දායක වන පෝෂක වර්ගය කුමක්ද? (ලකුණු 01)

iv. විද්‍යාගාරයේ දී අම්ල හා භස්ම හඳුනාගැනීම සඳහා විවිධ දර්ශක භාවිත වේ. පහත වර්ණ ලබා දෙන දර්ශක නම් කරන්න.

(a) භස්මවල දී රෝස පැහැය සහ අම්ලවල දී අවර්ණ

(b) භස්මවල දී කහ පැහැය සහ අම්ලවල දී රතු පැහැය

(ලකුණු 02)

(මුළු ලකුණු 11)

04. (A) රූපයේ දැක්වෙන්නේ ධාරිත්‍රයක ආරෝපණය වීම හා විසර්ජනය වීම ආදර්ශනය කිරීමට සැකසූ පරිපථයකි. එහි S ස්විච්චය P හා සම්බන්ධ කළ විට ධාරිත්‍රකය ආරෝපණය වීමත්, Q හා සම්බන්ධ කළ විට ධාරිත්‍රකය විසර්ජනය වීමත් මෙහි දී බලාපොරොත්තු වේ.




i. ධාරිත්‍රකයක් විසර්ජනය වීම යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? (ලකුණු 01)

ii. ඉහත පරිපථයේ ධාරිත්‍රකය විසර්ජනයේ දී LED ය දැල්වීමක් අපේක්ෂා කළ මුත් එය නොදැල්විනි. ඊට හේතුව කුමක් ද? (ලකුණු 01)

iii. ධාරිත්‍රක තුළ ගබඩාවන ආරෝපණ ප්‍රමාණය මනිනු ලබන ඒකකය කුමක් ද? (ලකුණු 01)

iv. පෑන් බටයක් සවිකර සැකසූ පාට කළ ජලය සහිත කුඩා වීදුරු බෝතලයක් අත් දෙකකින් තදින් අල්ලාගෙන සිටින අයුරු රූපයේ දැක්වේ.




(a.) මෙහි දී අපේක්ෂා කරන නිරීක්ෂණය කුමක් ද? (ලකුණු 01)

(b.) එම නිරීක්ෂණය ලැබීමට හේතුව කුමක් ද? (ලකුණු 01)

(c.) මෙම උපකරණයේ ක්‍රියාකාරිත්වයට සමගාමීව සකසා ඇති මිනුම් උපකරණය කුමක් ද?

(ලකුණු 01)